**ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය සහ ආදායම් ගිණුම විභාග දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී.සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරන විගණන වර්තාව 2018 ඔක්තෝබර් 16 දින කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විභාග දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.11 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේදී අනාවරණය වු පහත සඳහන් සටහනේ සරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණ වලට යටත්ව ගණන් දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතු භාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි | **මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | **ගණන්දීමේ නිලධාරි විසින් විධිවිධානයට අනුගත නොවීම්** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දරන බවත් | 1. ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් නොකිරිම/ ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරිම. | 2.2 |
| | | 2. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරිම | 2.6 |
| | | 3. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.9 |
| | | 4. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.1. |
| | | 5. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2 |
| 128(1)(ආ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බවත් | අනුකූල නොවීම් | 2.10 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බවත් | ආදායම් ගිණුම්වල අඩුපාඩු | 2.7 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බවත් | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බව සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟ හිටි ණය ශේෂ අය කර ගැනීම් | 2.8 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බවත් | අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම | 2.5 |
| 128(1)(ඒ) | දරන ලද කිසියම් වියදමක් හෝ වගකීමක් බැඳීමක් වුවද, තම වැය විෂය පථය හෝ සීමාවන් හෝ වෙනත් බලය දෙනු ලැබූ මූල්‍ය ප්‍රතිපාදනයක ඇතුළත වැටෙන බවට හා එය ප්‍රමාණවත් තරම් අධිකාර බලයෙන් ආවරණය වන බව | බැඳීම් හා බැරකම් | 2.4 |

**මුදල් රෙගුලාසි 128(2) - රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය**

| | | | |
|---|---|---|---|
| 128(2)(ආ) | මුදල් වර්ෂය අවසානයේදී මුදල් රෙගුලාසි 151 ප්‍රකාරව ආදායම් ගිණුම් පිළියෙල කිරීම | ආදායම නිවැරදිව හදුනා නොගැනීම. | 2.7(අ) |
| 128(2)(ඉ) | රාජ්‍ය ආදායම් එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන්දීමේ නිලධාරීන් සහ දෙපාර්තමේන්තු විමසා, රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යොදන බව | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම. | 2.7(ආ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

**කාර්යභාරයන් ඉටු නොකිරීම**

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදය - නව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම**

2011 වර්ෂයේදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් මතු වූ ගැටළු විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද විද්වත් කමිටු යෝජනාවක් ලෙස මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට තීරණය කර තිබුණි.දෙපාර්තමේන්තුව විසින් බඳවාගැනීම්, උසස්කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග ආදී ආයතනික විභාග 300 ක් පමණ පැවැත්වීමට හා ඇගයීම් කිරීම සඳහා පාසල් වසාදැමීමට සිදුවීම වැලැක්වීම, උත්තර පත්‍ර එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස භාවිතාකිරීම, උත්තර පත්‍ර පැනල් කිරීමේ කාර්යයන් ආරක්ෂාකාරී ලෙස සිදුකිරීම ආදී අරමුණු ඉටුකරගැනීම සඳහා වර්ග මීටර් 425 ක බිම් ප්‍රමාණයක ඉදිකිරීමට අපේක්ෂිත මෙම සය මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත රු.564,320,835 ක (වැට් සහිත) මුදලකට පවරා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අංශයේ භාණ්ඩ වැඩ හා සේවා සඳහා පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී සියළුම කරුණු සැලකිල්ලට ගෙන හැකිතාක් දුරට නිවැරදි මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමට රාජ්‍ය ආයතන වගබලා ගතයුතු බව දක්වා තිබුණද විභාග දෙපාර්තමේන්තුවේ මෙම සය මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව උපකල්පනය කරන ලද රු. මිලියන 280 ක පිරිවැයක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණි.

(ආ) ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකර ගැනීමේ අරමුණ ඇතිව ලංසු කැඳවීමකින් තොරව රු. මිලියන 280 ක පිරිවැයකට ඉදිකිරීම් සිදුකිරීමට 2012 මාර්තු 22 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණු අතර ගොඩනැගිල්ල සඳහා පිරිවැය ඇස්තමේන්තු හෝ සැලසුම් සකස් නොකර අමාත්‍ය මණ්ඩලයට නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමකින් තොරව මෙම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) 2013 අගෝස්තු 05 දිනැති අංක 17/01/04/2012/21 දරන ලිපියෙන් පිරිවැය පරීක්ෂණ කමිටුව පිරිවැය විචලන ඡේද දක්වා වාර්තාවක් සකස්කර තිබුණද රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 05 දිනැති අංක PFD/MD/104/1/2/23 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියට අනුව සංසන්දනාත්මක ප්‍රකාශනයක් පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණු අතර මුල් පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණ නිසා සංසන්දනාත්මක ප්‍රකාශයක් සකස් කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.

(ඈ) 2015 වර්ෂය වනවිටද බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර 04 වන අමාත්‍ය මණ්ඩල සංදේශයද සකස්කර එමගින් රු. මිලියන 615 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර 2015 ජූලි 23 දිනැති අංක අමප/15/1000/628/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් එය අනුමත කරගෙන තිබුණි. 2016 දෙසැම්බර් 09 දිනැති අංක 1/1/CG/Ex දරන ලිපිය මගින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට කොන්ත්‍රාත්තුව ප්‍රදානය හා ගිවිසුම අත්සන් කිරීම සිදුකර තිබුණු අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී මාස 16 කට පසුව එම කටයුතු සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) විවෘත ලංසු කැඳවීමේ පටිපාටිය අනුගමනය කිරීමට වැඩි කාලයක් ගතවන බැවින් ලංසු කැඳවීමකින් තොරව ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවටත් උපදේශන සේවය ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශයටත් පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණු අතර මෙලෙස විවෘත ලංසු කැඳවීමකින් තොරව කොන්ත්‍රාත්තුව ඍජුව පැවරීමේ මූලික අරමුණ වූයේ ගොඩනැගිල්ලේ කටයුතු කඩිනමින් අවසන් කිරීම වුවත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක තත්වයට ගෙන ඒමට වර්ෂ 05 කට ආසන්න කාලයක් ගත වී තිබුණ බව නිරීක්ෂණය විය.

(ඊ) විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ 2012 දෙසැම්බර් 11 වන දිනැති අංක 17/01/4/2012/09 දරන රාජ්‍ය ඉංජිනේරු සංස්ථා සභාපති අමතන ලද ලිපියට අනුව සංස්ථාවේ නිර්දේශ මත ඉදිකිරීමට අවශ්‍ය බිම සඳහා මිනින්දෝරු පිඹුරක් (Plan) සකස් කර ගැනීමට 2012 දෙසැම්බර් 28 දින පුද්ගලික ආයතනයකට රු.68,544 ක් ගෙවීම් කර තිබුණද එවැනි පිඹුරක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(උ) දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීමට යෝජිත ගොඩනැගිලි භූමියේ පසෙහි තත්ත්වය පරීක්ෂාකර වාර්තාවක් ලබාගැනීම සඳහා 2013 ජූලි 08 දින රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් නිර්දේශ කරන ලද පෞද්ගලික ආයතනයකින් වාර්තාවක් ලබාගෙන 2013 සැප්තැම්බර් 13 දින රු.161,375 ක් ගෙවා තිබුණි. පසුව එම වාර්තාවේ දත්ත ප්‍රමාණවත් නැති බැවින් නැවතත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙතින් වාර්තාවක් ලබාගෙන 2016 පෙබරවාරි 24 දින රු.419,663 ක් ගෙවා තිබුණු අතර දෙපාර්තමේන්තුව මනා සැලසුමකින් තොරව කටයුතු කිරීම නිසා එකම කාර්යයකට දෙවරක් ගෙවීම් කිරීමට සිදුව ඇති බව නිරීක්ෂණය විය.

(ඌ) ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ කඩුවෙල නගර සභාවෙන් වර්ෂයක කාලයකට නිකුත් කර තිබුණු 2016 අප්‍රේල් 07 දිනැති අංක B/BB/886/15 දරන සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලසීමාව 2017 අප්‍රේල් 07 දිනෙන් අවසන් වුවද එම බලපත්‍රයේ වලංගු කාලය දීර්ඝ කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(එ) දෙපාර්තමේන්තුව සයමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2017 මාර්තු 07 දින ආරම්භ කළද සිදුකළ යුතු ඉදිකිරීම් කටයුතු හා එම කටයුතු සිදුකිරීමට අපේක්ෂිත දිනයන් ඇතුළත් වැඩසටහන ඉදිරිපත් කිරීමට ඉදිකිරීම් කටයුතු සිදුකරන ආයතනය විසින් මාස 10 ක කාලයක් ගතකර 2018 ජනවාරි මස දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි.

(ඒ) දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ඉදිකෙරෙමින් පවතින ගොඩනැගිල්ලේ ගොඩනැගිලි ඉදිකිරීම් වැඩසටහන් සැලැස්මට අනුව 2017 දෙසැම්බර් 31 දිනට බිම්මහලේ කණු, බීම්, ස්ලැබ්, පඩිපෙළ හා මෙසන් වැඩද පළමු හා දෙවන මහලේ කණු, බීම්, ස්ලැබ්, පඩිපෙළද තුන්වන මහලේ කණු ආදී කොටස්ද නිම කළ යුතු වුවද 2018 පෙබරවාරි 28 දින වනවිට බිම් මහලේ වැඩද අවසන් කර නොතිබුණි.

(ඔ) 2017 අප්‍රේල් මස සිට දෙසැම්බර් මාසය දක්වා මාස 09 ක කාලය තුළ වැඩ කළ හැකි මිනිස් දින 275 ක් තිබුණද ඉදිකිරීම් කටයුතුවල නිරත වී ඇති ආයතනයේ ව්‍යාපෘති කළමනාකරු, වැඩබිම් කළමනාකරු, ව්‍යාපෘති ඉංජිනේරු ඇතුළු නිලධාරීන් දිවා, රාත්‍රී සේවයට වාර්තා කිරීමේ මුළු දින ගණන ඉතාමත් අඩු මට්ටමක පැවති අතර ව්‍යාපෘතියේ නියමිත කාලයට කළයුතු වැඩ කොටස් නිමකිරීමට නොහැකිවීමට මෙම තත්වයද හේතුවක් වී තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.

(ඕ) ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා ඉදිකිරීම් කටයුතු සිදුකරන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ උපදේශකයන් වන ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශ නිලධාරීන් සහභාගී වී තිබුණු අතර එහිදී ඉදිකිරීම් ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීමට 2017 ජනවාරි සිට 2018 ජනවාරි දක්වා රැස්වීම් 22 ක් පවත්වා තිබුණි. මෙම රැස්වීම් සඳහා ඉදිකිරීම් ආයතනය වෙනුවෙන් කළමනාකරු (ඉදිකිරීම්) රැස්වීම් වාර 13 ක් හා ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති කළමනාකරු රැස්වීම් වාර 09 ක් සඳහාම සහභාගී වී නොතිබුණු අතර ඉදිකිරීම් ප්‍රගතිය අපේක්ෂිත ඉලක්ක කරා ලගාවීම ප්‍රමාද වීමට රැස්වීම් සඳහා වගකිවයුතු නිලධාරීන්ගේ සහභාගීත්වය අඩුවීමද බලපා ඇති බව නිරීක්ෂණය විය.

(ක) ගොඩනැගිල්ල වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කටයුතු සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු.54,949,803 ක් හා උපදේශනය වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යංශයට රු.9,033,580 ක් ඇතුළුව එකතුව රු.63,983,383 ක මුදලක් ගෙවා තිබුණු අතර ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට අපේක්ෂිත දිනයන් ඇතුළත් වැඩසටහනට අනුව භෞතික ප්‍රගතිය සියයට 26 ක ප්‍රමාණයක තිබිය යුතු වුවත් තථ්‍ය ප්‍රගතිය සියයට 12 ක් බව ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂණය විය.

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම**

---

**රහස්‍ය ලේඛන ප්‍රවාහනය සඳහා කුලී පදනම මත බස් රථ හා ලොරි රථ ලබාගැනීමේ ප්‍රසම්පාදනය**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තු ගත වටිනාකම රු.15,000,000 ක් වූ රහස්‍ය ලේඛන ප්‍රවාහනය සඳහා කුලී පදනම මත වාහන ලබාගැනීමට අදාළ ප්‍රසම්පාදනය 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.3.11 මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලියට සහභාගී වන සියලුම ලංසුකරුවන් විසින් නියමිත ආකෘති පත්‍ර ප්‍රකාරව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු බව සඳහන් කර තිබුණද ආයතනය විසින් ලංසු සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන කොන්දේසි අනුව රහස්‍ය ලේඛන ප්‍රවාහනය සඳහා යොදා ගන්නා ලොරි රථවල ධාවන මීටරය ක්‍රියාත්මක විය යුතු බව සඳහන් කර තිබුණ නමුත් එම කාර්යය සඳහා යොදාගත් වාහනවල ධාවන මීටර ක්‍රියාකාරී තත්ත්වයේ නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.10 මාර්ගෝපදේශය අනුව ලංසු කැඳවීමේ ලේඛනවල නිශ්චිතව දක්වා ඇති කාලසීමාවන් සඳහා වලංගු ලංසු ඉදිරිපත් කළ යුතු බවට ලංසු කරුවන්ට නියම කළ යුතු වුවද ලංසු කැඳවීමේ ලේඛනයෙහි ලංසු වලංගු කාලයක් සඳහන් කර නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසුව සූදානම් කිරීම සඳහා ලංසුකරුවකුට අවශ්‍ය වන සියලු තොරතුරු ලංසු කැඳවීමේ ලේඛනයෙහි අන්තර්ගත විය යුතු වුවද මිල ගණන් ඉදිරිපත් කිරීමට අදාළ නිර්නායක ප්‍රසම්පාදන දැන්වීමෙහි ප්‍රමාණාත්මක පරිද්දෙන් නිරවුල්ව ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) ආයතනය විසින් රහස්‍ය ලේඛන ප්‍රවාහනය සඳහා තෝරාගන්නා ලද ලංසුකරු සමග 2016 නොවැම්බර් 16 දින අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමෙහි එක් එක් පාර්ශවය වෙනුවෙන් සාක්ෂි වශයෙන් දෙදෙනෙකු අත්සන් කළ යුතු වුවද ලොරි රථ ගිවිසුමේ පාර්ශවයන් දෙකම හා බස් රථ ගිවිසුමේ විභාග දෙපාර්තමේන්තුව පාර්ශවයෙන් සාක්ෂි අත්සන් කර නොතිබුණි.

(උ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.3.1 (අ) (ආ) මාර්ගෝපදේශය අනුව ජාතික ප්‍රසම්පාදන නියෝජනායතනය මගින් අනුමත කරන ලද සම්මත ලංසු කැඳවීමේ ලේඛනයක් ලංසු දත්ත පත්‍රිකාව හා විශේෂ කොන්දේසිවලට අවම වෙනස්කම් සහිතව යොදාගත යුතු වුවද මෙම ප්‍රසම්පාදනය සඳහා යොදාගෙන ඇති ලංසු කැඳවීමේ ලේඛන සම්මත ලංසු කැඳවීමේ ලේඛනයට අනුකූල නොවුණි.

(ඌ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 5.3.18 මාර්ගෝපදේශය ප්‍රකාරව වැට් බද්ද වෙන් වෙන් වශයෙන් සඳහන් කරන ලෙස ලංසුකරුවන්ට උපදෙස් දිය යුතු වුවද මෙම ප්‍රසම්පාදනයේදී ලංසුකරුවන් ඉදිරිපත්කරන ලද මිල ගණන් එකතු කළ අගය මත බදු සහිතද නැද්ද යන්න සඳහන් කර නොතිබුණි.

(එ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි පරිදි යම් නියමිත ගාස්තුවක් ගෙවීම් මත සුදුසුකම් ලත් ලංසුකරුවන්ට ලංසු ලේඛන ලබාගැනීමට ඉඩ සලසා දිය යුතු අතර රාජ්‍ය මුදල් චක්‍රලේඛ 6/2016 ට අනුව රු.15,000,000 ක් වටිනාකමැති මෙම ප්‍රසම්පාදනය සඳහා ආපසු නොගෙවන තැන්පතු වශයෙන් රු.3,500 සිට රු.12,500 අතර මුදලක් අය කළ යුතු වුවද ආයතනය විසින් මේ සඳහා රු.1,000 ක ආපසු නොගෙවන තැන්පතුවක් අයකර තිබුණි.

(ඒ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් හා අනෙකුත් නිලධාරීන්ට ගෙවීම් සිදුකිරීමේදී පදනම් කරගත යුතු ගෙවීම් ප්‍රමාණයන් නොසලකා හැර රු.10,250 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

----------------------------

ජංගම නොවන වත්කම් සංචලන වාර්තාව තුළ ඉඩම් ලෙස රු.630,000,000 ක වටිනාකමක් සඳහන් කර තිබුණද ආයතනයේ ඉඩම මෙතෙක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 බැදීම් හා බැරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විසර්ජන ගිණුම සමග ඉදිරිපත් කර ඇති ඩී.ජී.එස්.ඒ. 8 (i) බැදීම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇති රු.60,162,351 ක බැදීම් සහ ඩී.ජී.එස්.ඒ. 8 (ii) බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇති රු.9,176,144 ක බැරකම් දෙපාර්තමේන්තුවේ බැරකම් ලේඛනයේ දක්වා නොතිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 (අ) ඡේදයට අනුකූල නොවී වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 127.4 ක ප්‍රතිපාදනය රු.මිලියන 8.2 කින් ඉක්මවා රු.මිලියන 9.6 ක බැදීම් ඇති කරගෙන තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට බැරකම් රු.12,975,360 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 2.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ආයතනික විභාග සඳහා පරීක්ෂකවරුන් තෝරාගැනීමේ ක්‍රමවේදය සහ එහි ස්වාධීනත්වය**

රාජ්‍ය අංශයේ ආයතනික විභාග පැවැත්වීමේ මූලික හා එකම ආයතනය විභාග දෙපාර්තමේන්තුව වන අතර ආයතනික විභාගවල බහුවරණ හා අනෙක් උත්තර පත්‍ර පරීක්ෂාකිරීම සඳහා පරීක්ෂකවරුන් බඳවාගැනීම හා සේවයේ යෙදවීම පිළිබඳව විධිමත් ක්‍රමයක් හෝ තෝරාගන්නා ලද පරීක්ෂකවරුන්ට දෙනු ලබන විභාග ප්‍රමාණය හා උත්තර පත්‍ර ප්‍රමාණය තීරණය කිරීමේ නිශ්චිත පදනමක්, ලිඛිත නිර්නායකයක් හෝ ප්‍රතිපත්තිමය තීරණයක් දෙපාර්තමේන්තුව තුළ නොතිබුණි.

**(ආ) ආයතනික විභාගවල උත්තර පත්‍ර පරීක්ෂාකිරීම් කටයුතුවල ස්වාධීනත්වය**

(i) සිදුකරන ලද නියැදි පරීක්ෂණයට අදාළ කරගත් 2017 ජනවාරි සිට 2017 ජූනි 30 දක්වා විභාග 16 ක බහුවරණ උත්තර පත්‍ර පරීක්ෂාව සඳහා යොදාගත් පරීක්ෂකවරුන්ගෙන් වැඩි ප්‍රමාණයක් දෙපාර්තමේන්තු කොමසාරිස්, නියෝජ්‍ය කොමසාරිස් හා සහකාර කොමසාරිස්වරුන් වූ අතර උත්තර පත්‍ර 64,002 ක් සඳහා එකතුව රු.6,111,560 ක දීමනා ඔවුන් වෙත ගෙවා තිබුණි. නියමිත තනතුරේ පවතින වගකීමට අමතරව පරීක්ෂණ කටයුතු සිදුකිරීමේදී උත්තර පත්‍ර පරීක්ෂාකිරීමේ ගුණාත්මකභාවය පිළිබඳව ගැටළු ඇතිවිය හැකි බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ii) ආයතනික විභාග 06 ක බහුවරණ උත්තර පත්‍ර පරීක්ෂා කිරීම සඳහා ලියාපදිංචිව සිටි නිලධාරීන්ගෙන් වැඩි ප්‍රමාණයක් එනම් 191 ක්ම දෙපාර්තමේන්තු නිලධාරීන් වූ අතර උත්තර පත්‍ර පරීක්ෂකවරුන් කාලීනව වෙනස් කිරීමටද කටයුතු කර නොතිබුණි.

**(ඇ) ආයතනික විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම සහ පරිවර්තනය කිරීම**

2017 ජනවාරි සිට ජූනි දක්වා ආයතනික විභාග 70 ක් පැවැත්වීමට ප්‍රශ්න පත්‍ර සකස්කර තිබුණු අතර ඉන් අවස්ථා 14 කදී කොමසාරිස් (මුදල්) විසින් මුදල් රෙගුලාසි සම්බන්ධ ප්‍රශ්න

පත්‍ර සකස් කර තිබුණි. දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරියෙක් විසින් ප්‍රශ්න පත්‍ර සකස් කිරීමෙන් විභාග ප්‍රශ්න පත්‍ර සම්බන්ධව පවතින ස්වාධීනත්වය, රහස්‍යභාවය සහ විනිවිදභාවය පිළිබඳව විගණනයට ගැටළුකාරී විය.

**(ඇ) ආයතනික විභාග පැවැත්වීම සහ බඳවාගැනීම් සිදුකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2017 අප්‍රේල් මස පැවති ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවාගැනීමේ සීමිත/විවෘත තරග විභාගය සඳහා දෙපාර්තමේන්තුව විසින් රු.9,070,053 ක වියදමක් දරා තිබුණද විභාගයේදී සිදුවූ අක්‍රමිකතා නිසා විභාගය අවලංගු කර 2018 ජනවාරි සහ පෙබරවාරි මස එය නැවත පැවැත්වීමට කටයුතු කර තිබුණි.

(ii) විභාග දත්ත සහකාර තනතුරේ පුරප්පාඩු 43 ක් සඳහා බඳවාගැනීම වෙනුවෙන් 2016 අප්‍රේල් මාසයේදී පවත්වන ලද ලිඛිත විභාගයට අයදුම්කරුවන් 1,762 ක් පෙනී සිට තිබුණි. ඉන් සමත් 89 දෙනෙකු වෙනුවෙන් වූ ප්‍රායෝගික පරීක්ෂණයෙන් 77 ක් සමත්ව තිබුණු අතර සුදුසුකම් පරීක්ෂාකිරීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු සියයට 40 ක් ලබාගත් අයදුම්කරුවන් 43 දෙනෙකු තනතුර සඳහා සුදුසුකම් ලබා තිබුණි. මෙම විභාගය හා සම්මුඛ පරීක්ෂණ සඳහා රු.714,241 ක වියදමක් දරා තිබුණද අවසාන වශයෙන් පුරප්පාඩු 06 ක් සඳහා පමණක් පත් වීම් පිරිනමා තිබුණි.

(iii) දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා 2017 පෙබරවාරි මස රු.16,360 ක වියදමක් දරා අයදුම්කරුවන් 52 ක් වෙනුවෙන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබුණු අතර විගණිත දිනය වන විටත් මෙම තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ) සහතික පත්‍ර ශාඛාව**

සහතිකපත්‍ර ශාඛාව විසින් 1992 වර්ෂයේ සිට පවත්වා තිබුණු විභාගවල ප්‍රතිඵල පරිගණක පද්ධතියට ඇතුළත් කර තිබුණද 1992 ට පෙර විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද විභාගවල ප්‍රතිඵල පරිගණක පද්ධතියට ඇතුළත් කර නොමැති වීම හේතුවෙන් පහසුවෙන් සහ වේගවත්ව එම ප්‍රතිඵල සනාථ කිරීමට හෝ ප්‍රතිඵල නිකුත් කිරීමට අපහසුවී තිබුණි.

## 2.6 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 2,018 | 2,014 | 14 | 0.69 |
| | මූලධන | 188 | 49 | 130 | 69.10 |
| | **එකතුව** | **2,206** | **2,063** | **144** | **6.52** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2014 | පුනරාවර්තන | 2,493 | 2,491 | 2 | 0.08 |
| | මූලධන | 211 | 155 | 56 | 26.50 |
| | **එකතුව** | **2,704** | **2,646** | **58** | **2.14** |
| 2015 | පුනරාවර්තන | 3,030 | 2,980 | 50 | 1.65 |
| | මූලධන | 166 | 42 | 124 | 0.60 |
| | **එකතුව** | **3,196** | **3,022** | **174** | **5.44** |
| 2016 | පුනරාවර්තන | 2,925 | 2,894 | 31 | 1.05 |
| | මූලධන | 335 | 287 | 48 | 14.32 |
| | **එකතුව** | **3,260** | **3,181** | **79** | **2.42** |
| 2017 | පුනරාවර්තන | 3,108 | 2,864 | 244 | 7.85 |
| | මූලධන | 783 | 147 | 636 | 8.12 |
| | **එකතුව** | **3,891** | **3,011** | **880** | **22.61** |

**විසර්ජන ගිණුම**

**-----------------**

**සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

**-----------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 03 කට අදාළව වර්ෂය තුළ වෙන්කරන ලද ප්‍රතිපාදන වියදම් නොකිරීම හේතුවෙන් සියයට 32 සිට සියයට 99 ක් දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂය අංක 212-2-1-0-1404 සඳහා රු.1,000,000 ක මූලික ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණු අතර වර්ෂය තුළදී මුදල් රෙගුලාසි 66 යටතේ එම ප්‍රතිපාදනයෙන් රු.700,000 ක මුදලක් වෙනත් වැය විෂයයකට මාරු කර තිබියදීත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ක් ඉතිරිවී තිබුණි.

**2.7 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**--------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත අංක 20.03.02.13 යටතේ එකතුව රු.මිලියන 420 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 413 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 98 ක් වී තිබුණි. මෙම අදායම් ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විභාග පැවැත්වීම වෙනුවෙන් රජයේ සහ රාජ්‍ය නොවන ආයතන වෙතින් ලැබූ ආදායම් සමාලෝචිත වර්ෂයේ ජූනි මස දක්වාම 20.03.02.13 දරන විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂයට බැරකර තිබුණද ජූලි මස සිට දෙසැම්බර් මස දක්වා ලැබී තිබුණු රු.50,392,882 ක ආදායම් 20.03.99.00 සංකේත අංක දරන රජයේ වෙනත් ලැබීම් ආදායම් ශීර්ෂයට බැරකර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ වල විභාග පැවැත්වීම වෙනුවෙන් අයවිය යුතු ආදායම්වලින් රු.2,513,345 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගැනීමට අපොහොසත් වී තිබුණි.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 21201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 35 | 34.9 | 20 | 20.2 | 100 | 79 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

(අ) වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ

(i) 2013 ජනවාරි සිට වැඩ තහනමකට ලක්ව සිටි නිලධාරියෙකුගෙන් රු.443,320 ක ණය ශේෂය අයකරගැනීම සඳහා ඔහුට එරෙහිව පරීක්ෂණ ආරම්භ කර තිබුණු අතර 2018 ජූනි මස දක්වාම එම පරීක්ෂණ අවසන් කර නොතිබුණි.

(ii) 2009 ජූලි 01 සිට වැඩ තහනමට ලක්ව සිටි තවත් නිලධාරියෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට රු.33,047 ක නිරවුල් නොවූ ණය ශේෂයක් පැවති අතර වැඩ තහනම් කළ දින සිට වසර 8 ½ ක කාලයක් තුළ රු.8,000 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ

1995 සිට 2008 දක්වා කාලය තුළදී සේවය හැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.115,351 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.9 අග්‍රිම ගිණුම**

වියදම් සීමාව ඉක්මවා අග්‍රිම ලබා ගැනීම හේතුවෙන් මාසය අවසානයේදී විශාල වශයෙන් අග්‍රිම සීමා ඉතිරිවීම් දක්නට ලැබුණු අතර වියදම් නිසි පරිදි කළමනාකරණය නොකිරීම හා අයවැය පාලනය නිසිපරිදි පවත්වාගෙන නොයෑම මෙලෙස අග්‍රිම ඉතිරිවීම් සඳහා හේතු වී ඇති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| මාසය | ආරම්භක ශේෂය | අග්‍රිම ලැබීම් | වෙනත් ලැබීම් | ගෙවීම් | ඉතිරිය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ජනවාරි | | 123,700,000 | 20,711,632 | 142,924,300 | 1,487,332 |
| පෙබරවාරි | 1,487,332 | 120,325,000 | 12,503,097 | 124,025,413 | 10,290,016 |
| මාර්තු | 10,290,016 | 697,250,000 | 20,286,257 | 679,749,885 | 48,076,388 |
| අප්‍රේල් | 48,076,388 | 32,000,000 | 7,855,801 | 72,997,236 | 14,934,953 |
| මැයි | 14,934,953 | 130,600,000 | 12,908,859 | 156,843,254 | 1,600,558 |
| ජූනි | 1,600,558 | 71,000,000 | 13,505,989 | 81,201,668 | 4,904,879 |
| ජූලි | 4,904,879 | 145,000,000 | 9,661,074 | 156,637,630 | 2,928,323 |
| අගෝස්තු | 2,928,323 | 81,000,000 | 16,768,825 | 98,385,433 | 2,311,715 |
| සැප්තැම්බර් | 2,311,715 | 178,500,000 | 13,724,318 | 172,282,413 | 22,253,620 |
| ඔක්තෝබර් | 22,253,620 | 586,500,000 | 495,221,887 | 651,605,161 | 452,370,346 |
| නොවැම්බර් | 452,370,346 | 296,500,000 | 14,804,434 | 311,714,433 | 451,960,347 |

## 2.10 අනුකූල නොවීම්

### 2.10.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 142(1)(2) | | රජයට ලැබිය යුතු මුදල් හෝ එම මුදල් අයකරගැනීම පිළිබඳ නිශ්චය කර නිර්ණය කලයුතු අතර එම මුදල් උපලබ්ධි වනතුරු එවැනි කිසිම සේවයක් හෝ සැපයුමක් නොකලයුතු වුවද ආයතනික විභාග පවත්වා ප්‍රතිඵල නිකුත් කළ පසුව ආයතනික විභාග පැවැත්වීම වෙනුවෙන් ගාස්තු අයකර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 177(1) | 55,604,862 | එකතු කරගන්නා මුදල් දිනපතා හෝ හැකිතාක් අප්‍රමාදව බැංකුගත කළ යුතු වුවද දෙපාර්තමේන්තුව වෙත බාහිර ආයතන මගින් ප්‍රේෂණය කරන ලද චෙක්පත් 173 ක් දින 02 සිට දින 15 දක්වා අතර කාලයක් ප්‍රමාදව බැංකු ගත කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 396 (ඇ) | 1,869,714 | බැංකු ගිණුම් 02 කට අදාළව නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ මාස 06 ක් ඉක්මවූ චෙක්පත් 465 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2008 ජූනි 09 දිනැති අංක PF/FS/Audit T38 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | 515,624 | හඳුනානොගත් හර හා බැර ශේෂ නොපමාව හඳුනාගෙන ගැලපීම් කළයුතු වුවත් 2016 ඔක්තෝබර් මස සිට 2017 නොවැම්බර් මස දක්වා හඳුනා නොගත් හර හා බැර ශේෂ සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. |

**2.10.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

**-------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ආකාරයෙන් ක්‍රියාකළ අවස්ථා පහත දැක්වේ.

**උපයන විට ගෙවීම් බදු**

**----------------------------**

(අ) දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 2015 ජූලි 06 දිනැති අංක SEC/2015/05 අංක දරන චක්‍රලේඛයට අනුව 2017 ජනවාරි සිට ජූනි දක්වා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින් 56 ක් වෙනුවෙන් උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී රු.859,673 ක් අඩුවෙන් ගණනය කර තිබුණු අතර මේ හේතුවෙන් රජයට හිමිවිය යුතු බදු ආදායම එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ආ) නිලධාරීන් 56 දෙනෙකු මාසිකව රු.62,500 ඉක්මවා ආදායම් උපයන බව නිරීක්ෂණය වූ අතර එම නිලධාරීන් විසින් 2017 ජනවාරි සිට ජූනි දක්වා උපයන ලද එකතුව රු. 12,041,570 ක් වූ දීමනා උක්ත චක්‍රලේඛය ප්‍රකාරව සැලකිල්ලට නොගෙන උපයන ස්ථිර මාසික වැටුප පමණක් සැලකිල්ලට ගෙන බදු ගණනය කර තිබුණි.

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (බදු ප්‍රතිපත්ති, නීති සහ ජාත්‍යන්තර කටයුතු) සහ සභාපති (අර්ථ නිරූපණ කමිටුව) ගේ 2012 දෙසැම්බර් 13 දිනැති අංක IC/2012/49 දරන ලිපිය මගින් විභාග දෙපාර්තමේන්තුවේ රාජකාරී, හදිසි, ප්‍රමුඛ සේවා හෝ විශේෂිත කාර්යය සඳහා කරනු ලබන ගෙවීමක් ලෙස සලකා SEC/2011/05 4 (IX) වගන්තිය යටතේ බද්දෙන් නිදහස් කළ නොහැකි වන බවත්, විභාග දෙපාර්තමේන්තුවේ දීමනා ගෙවනු ලබන රාජකාරී විභාග දෙපාර්තමේන්තුවේ නිත්‍ය හා සාමාන්‍ය කාර්යයන් බැවින් ඉන් උපයන ආදායම බද්දට යටත් වන බවත් අවධාරණය කර තිබුණි.එහෙත් දෙපාර්තමේන්තුව විසින් එම කරුණු පිළිබඳ අවධානය යොමු නොකර දීමනා සැලකිල්ලට ගැනීමකින් තොරව ස්ථිර මාසික වැටුප පමණක් සැලකිල්ලට ගෙන උපයන විට බදු ගණනය කිරීම විගණනයට ගැටළු සහගත විය.

(ඈ) ආදායම් බදු කොමසාරිස් ජනරාල්ගේ 2015 ජූලි 06 දිනැති අංක SEC/2015/05 දරන චක්‍රලේඛයේ 3(II) ඡේදය අනුව ඉන්ධන දීමනාවද බද්දට යටත් වන නමුත් වැටුප් අංක 15 දරන නිලධාරියාගේ උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී ජනවාරි සිට ජූනි දක්වා රු.96,900 ක ඉන්ධන දීමනාව බද්දෙන් නිදහස් ආදායමක් ලෙස සලකා උපයන විට ගෙවීම් බදු ගණනය කර තිබුණි.

## 2.11 මානව සම්පත් කළමනාකරණය

### 2.11.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 303.3 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.494,075 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 85 | 76 | 09 | |
| (ii) | තෘතියික මට්ටම | 18 | 10 | 08 | |
| (iii) | ද්විතියික මට්ටම | 407 | 319 | 88 | |
| (iv) | ප්‍රාථමික මට්ටම | 164 | 153 | 11 | |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | -- | 56 | -- | 56 |
| | එකතුව | 674 | 614 | 116 | 56 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතාවය වර්තමානයට ගැලපෙන පරිදි දෙපාර්තමේන්තුව විසින් තීරණය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් විභාග දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2000 වර්ෂයේ අවශ්‍යතාවය අනුව සැකසූ එකක් බව නිරීක්ෂණය විය.

(ii) 2017 වර්ෂය අවසානය වන විට රාජ්‍ය කළමනාකරන සහකාර තනතුරු 80 කිනුත් තොරතුරු හා සන්නිවේදන සහකාර තනතුරු 45 කිනුත් කාර්යාල කාර්ය සහායක තනතුරු 85 කිනුත් වැඩිකළ යුතු බව හඳුනා ගෙන තිබුණද ඒ අනුව අනුමත තනතුරු සංඛ්‍යා තිරණය කර අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) විධිමත් අනුමැතියකින් තොරව අනුමත සංඛ්‍යාව ඉක්මවා සේවකයන් 56 ක් බඳවාගෙන තිබුණි.

(iv) දෙපාර්තමේන්තුවේ සේවාවන් කාර්යක්ෂමව ඉටුකිරීමටත් අභ්‍යන්තර පාලනය ශක්තිමත් වීමටත් දෙපාර්තමේන්තුවේ ශාඛා අතර අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අවම වශයෙන් වසර 05 කට වරක්වත් සිදුකළ යුතු වුවත් එකම ශාඛාවක් තුළ වසර 10 කට වඩා වැඩි කාලයක් සේවය කරන නිලධාරීන් 23 ක් සිටින බව නිරීක්ෂණය විය.